# ජාතික රාජ්‍ය සභාවේ
# 1975 අංක 14 දරන
# ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත

[සහතිකය සටහන් කළේ 1975 මාර්තු මස 17 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1975 මාර්තු මස 27 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

# ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 14 දරන
# ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත

[සහතිකය සටහන් කළේ 1975 මාර්තු මස 17 වන දින]

එල්. ඩී.—ඕ. 65/71.

**ශ්‍රී ලංකා තේ මණ්ඩලය පිහිටුවීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික වූ කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.

**1.** (1) මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) මේ පනතේ මේ වගන්තියෙහි සහ 20 වන වගන්තියෙහි විධිවිධාන මේ පනත ආරම්භ වන දින ක්‍රියාත්මක වන්නේය.

(3) මේ වගන්තිය සහ 20 වන වගන්තිය හැර මේ පනතෙහි සෙසු විධිවිධාන, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන, මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන දිනයක ක්‍රියාත්මක වන්නේය.

ශ්‍රී ලංකා තේ මණ්ඩලය පිහිටුවීම.

**2.** මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන්නා වූ ද ශ්‍රී ලංකා තේ මණ්ඩලය යනුවෙන් නම් කරනු ලබන්නා වූ හා හඳුන්වනු ලබන්නා වූ ද මණ්ඩලයක් මේ පනතේ විධිවිධානවලට අනුකූලව පිහිටුවනු ලැබේ.

මණ්ඩලය සංස්ථාවක් වන බව සහ දේපළ අත්කර ගැනීමේ බලය ඊට තිබෙන බව.

**3.** (1) මණ්ඩලය අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් වේ. ස්වකීය සංස්ථා නාමයෙන් සංස්ථාව විසින් නඩු පැවරීම ද එම නාමයෙන් සංස්ථාවට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කළ හැකි වන්නේය.

(2) චංචල හා නිශ්චල යන දෙවර්ගයේ ම දේපළ අත්කර ගැනීමට හා තබා ගැනීමට හෝ ඒ පිළිබඳ කළමනාකරණයට ද ඒවා විකිණීමට හා ඒ පිළිබඳව සුදුස්සක් කිරීමට ද ගිවිසුම්වලට බැඳීමට ද, මේ පනතේ විධිවිධාන ක්‍රියාවෙහි යෙදීම සඳහා අවශ්‍ය විය හැකි වෙනත් සියලු ක්‍රියා හෝ දේවල් කිරීමට සහ ඉටු කිරීමට ද මණ්ඩලයට බලය ඇත්තේය.

මණ්ඩලයේ පරමාර්ථ හා සාමාන්‍ය බලතල.

**4.** (1) සුදුසු යයි මණ්ඩලය විසින් සලකනු ලබන ක්‍රියා මාර්ගවලින් ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ දියුණුවට අනුබල දීම මණ්ඩලයේ පරමාර්ථ වන්නේය.

(2) මණ්ඩලය ශ්‍රී ලංකාවෙහි තේ කර්මාන්තයේ කටයුතු විධිමත් කිරීම සඳහා වගකිව යුතු බලධරයා වන අතර (1) වන උප වගන්තියේ විධිවිධානවල සහ මේ පනතෙහි වෙනත් විධිවිධානවල ව්‍යාප්තියට හානියක් නොමැතිව පහත දැක්වෙන කටයුතු කිරීමට මණ්ඩලය විසින් පියවර ගත හැකිය :—

(අ) අලුත් ප්‍රදේශවල තේ නිෂ්පාදනය කිරීම සහ වගා කිරීම, දැනට ඇති වතු සහ කුඩා ඉඩම් වැනි අස්වැන්නක් ලැබෙන තේ වර්ග යොදා නැවත වගා කිරීම, වතු සහ කුඩා ඉඩම්

1—ඒ 11361—10,999 (74/12)

පුනරුත්ථාපනය කිරීම, සත්ව පාලන කර්මාන්ත ඇති කොට පවත්වා ගෙන යාමෙන් වතු සහ කුඩා ඉඩම් නානාංග කරණය කිරීම සහ ඒ වතුවල සහ කුඩා ඉඩම්වල තේ වෙනුවට වෙනත් වගා යෙදීම යන මේවා විධිමත් කිරීම ;

(ආ) තේ කර්මාන්ත ශාලා පිහිටුවීම හා පවත්වාගෙන යාම විධිමත් කිරීම ;

(ඇ) තේ වෙන්දේසි පැවැත්වීම විධිමත් කිරීම ;

(ඈ) තේ වෙළඳාම හා තේ අපනයනය කිරීම ද, පිටරටවල දී තේ වෙළඳාම් කිරීමෙහි ලා තේ නැව්ගත කිරීම, නැව් ගාස්තු, තැරැව් ගාස්තු, ගුදම් ගාස්තු යන මේවාට හෝ වෙන යම් ගාස්තුවලට අදාළ කටයුතු සහ ගෙවීම් ද විධිමත් කිරීම ;

(ඉ) ශ්‍රී ලංකාවෙහි දී හා ඉන් පිටත දී තේ අලෙවි කිරීමට සහාය වීම, ධෛර්ය දීම සහ ලෝක වෙළඳ පොළවල තේ සඳහා වූ ඉල්ලීම් සහ තේ පරිභෝජනය වැඩි දියුණු කිරීම ;

(ඊ) තේ නිෂ්පාදනය කිරීම හා සැදීම, තේ ගසට වැළඳෙන පළිබෝධ හා රෝග පාලනය කිරීම සහ තේවල තත්ත්වය දියුණු කිරීම කෙරෙහි බලපාන සියලු ප්‍රශ්න හා කරුණු පිළිබඳව විද්‍යාත්මක හා ශිල්පීය පර්යේෂණ හා විමර්ශන පැවැත්වීම, ඊට සහාය වීම හා ධෛර්ය දීම සහ ස්වකීය අභිමතය පරිදි ඒ පර්යේෂණවල ප්‍රතිඵල පිළිබඳ තොරතුරු ප්‍රසිද්ධ කිරීම හා පතුරුවා හැරීම ;

(උ) ශ්‍රී ලංකාවෙහි හා වෙනත් රටවල තේ කර්මාන්තයෙහි අනාගත ආර්ථික නැඹුරුතාවන් ඇතුළුව තේ කර්මාන්තයෙහි ආර්ථික තත්ත්වය පිළිබඳ පර්යේෂණ පැවැත්වීම, ඊට සහාය වීම හා ධෛර්ය දීම ;

(ඌ) ශ්‍රී ලංකාවෙහි තේ කර්මාන්තයේ සංවර්ධනය සඳහා අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර, උපකරණ හා වෙනත් දේවල් ලබා ගැනීම හෝ ලබා ගැනීම පහසු කිරීම ;

(එ) තේ වගා කිරීමෙහි හෝ නිෂ්පාදනයෙහි නියුක්තව සිටින තැනැත්තන්ට මුදලෙන්, උපදෙස් දීමෙන් හෝ අන් අයුරින් සහාය වීම ;

(ඒ) තේ කර්මාන්තයෙහි නියුක්ත කම්කරුවන්ගේ වැඩ ප්‍රමාණය වැඩිවීමට අනුබල ලැබෙන පරිදි මෙන් ම ඔවුන්ගේ ආර්ථික හා සමාජ සුභ සිද්ධිය නිසැකව සිදුවන පරිදි ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම ;

(ඔ) තේ වවන්නන්, නිෂ්පාදකයන්, වෙළෙන්දන් හා වෙනත් තැනැත්තන්ගෙන් තේ කර්මාන්තයට අදාළ කවර කරුණක් සම්බන්ධයෙන් වුව ද සංඛ්‍යා විස්තර රැස් කිරීම සහ මණ්ඩලයේ අභිමතය අනුව ඒවා ප්‍රසිද්ධ කිරීම ;

(ඔ) තේ වතු කළමණාකරණයෙහි ද තේ නිපදවීමෙහි හා අලෙවි කිරීමෙහි ද නියුක්ත සියළු ආයතන හා සංවිධාන විධිමත් කිරීම, පාලනය කිරීම සහ මෙහෙයවීම ;

(ක) ශ්‍රී ලංකාවෙහි තේ කර්මාන්තයේ දියුණුව සඳහා ක්‍රියා කිරීමට අනුබල ලැබෙනු පිණිස හා එම ක්‍රියා ඒකාබද්ධ කිරීම පිණිස තේ කර්මාන්තය හා ආණ්ඩුවේ දෙපාර්තමේන්තු හෝ රාජ්‍ය සංස්ථා හා අතර අවශ්‍ය සම්බන්ධය ඇති කිරීම.

**මණ්ඩලය අමාත්‍යවරයාගේ විධානයන්ට යටත් විය යුතු බව.**

5. (1) (2) වන උපවගන්තියෙහි විධිවිධාන සලස්වා ඇති පරිදි හැර මණ්ඩලයේ බලතල ක්‍රියාවෙහි යෙදවීමේ දී, යුතුකම් ඉටු කිරීමේ දී සහ කාර්යයන් කිරීමේ දී අමාත්‍යවරයා විසින් කලින් කල නිකුත් කරනු ලබන විධානයන්ට මණ්ඩලය යටත් විය යුතු අතර ඒවාට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

(2) 4 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි (ඇ), (ඈ), (ඉ), (ඊ) සහ (ක) යන ඡේද යටතේ ගැණෙන කරුණු සම්බන්ධයෙන් මණ්ඩලයේ බලතල ක්‍රියාවෙහි යෙදවීමේ දී, යුතුකම් ඉටු කිරීමේ දී සහ කාර්යයන් කිරීමේ දී වෙළඳ විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් කලින් කළ නිකුත් කරනු ලබන විධානයන්ට මණ්ඩලය යටත් විය යුතු අතර, ඒවාට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

**මණ්ඩලයේ සංයුතිය.**

6. (1) මණ්ඩලය,—

(අ) අග්‍රාමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, මණ්ඩලයෙහි ප්‍රධාන විධායක විය යුතු, සභාපතිවරයකුගෙන් ;

(ආ) ක්‍රම සම්පාදන විෂය භාර අමාත්‍යාංශයෙහි ලේකම් වශයෙන් තත් කාලයෙහි ධුර දරන තැනැත්තාගෙන්, හෝ ඒ අමාත්‍යාංශය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඒ අමාත්‍යාංශයෙහි යම් ජ්‍යෙෂ්ඨ නිලධරයකුගෙන් ;

(ඇ) මුදල් විෂය භාර අමාත්‍යාංශයෙහි ලේකම් වශයෙන් තත් කාලයෙහි ධුර දරන තැනැත්තාගෙන්, හෝ ඒ අමාත්‍යාංශය භාර අමාත්‍යවරයා විසින් නම් කරණු ලබන ඒ අමාත්‍යාංශයෙහි යම් ජ්‍යෙෂ්ඨ නිලධරයකුගෙන් ;

(ඈ) වැවිලි කර්මාන්ත විෂය භාර අමාත්‍යාංශයෙහි ලේකම් වශයෙන් තත් කාලයෙහි ධුර දරන තැනැත්තාගෙන්, හෝ ඒ අමාත්‍යාංශය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඒ අමාත්‍යාංශයෙහි යම් ජ්‍යෙෂ්ඨ නිලධරයකුගෙන් ;

(ඉ) වෙළෙඳ විෂය භාර අමාත්‍යාංශයෙහි ලේකම් වශයෙන් තත් කාලයෙහි ධුර දරන තැනැත්තාගෙන්, හෝ ඒ අමාත්‍යාංශය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඒ අමාත්‍යාංශයෙහි යම් ජ්‍යෙෂ්ඨ නිලධරයකුගෙන් ;

(ඊ) නැව් කටයුතු පිළිබඳ විෂය භාර අමාත්‍යාංශයෙහි ලේකම් වශයෙන් තත් කාලයෙහි ධුර දරන තැනැත්තාගෙන් හෝ ඒ අමාත්‍යාංශය භාරව සිටින අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඒ අමාත්‍යාංශයෙහි ජ්‍යෙෂ්ඨ නිලධරයකුගෙන් ;

(උ) වාණිජ අධ්‍යක්ෂ වශයෙන් තත් කාලයෙහි ධුර දරන තැනැත්තාගෙන් ; හා

(ඌ) විශේෂයෙන් තේ වගා කිරීම, නිෂ්පාදනය කිරීම, විකිණීම, අපනයනය කිරීම හා මුදල් කටයුතු පිළිබඳ දැනුමක් සහිතව තේ කර්මාන්තය පිළිබඳ දැනීමක් හා පළපුරුද්දක් ඇති තැනැත්තන් අතුරින්, අග්‍රාමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, වෙනත් සාමාජිකයන් පස් දෙනකුගෙන්

සමන්විත වන්නේ ය.

(2) යම් තැනැත්තකු—

(අ) ජාතික රාජ්‍ය සභාවේ මන්ත්‍රීවරයකු නම් හෝ මන්ත්‍රීවරයකු වුවහොත් ; හෝ

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවේනොත් හෝ තමාගේ ශ්‍රී ලංකා පුරවැසිභාවය නැතිව ගියහොත්

ඒ තැනැත්තා මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් නම් කරනු ලැබීමට හෝ සාමාජිකයකු වශයෙන් ක්‍රියා කර ගෙන යෑමට නුසුදුසු වන්නේ ය.

(3) සභාපති ද (1) වන උපවගන්තියෙහි (ඌ) ඡේදය යටතේ නම් කරනු ලැබූ සාමාජිකයන් ද පස් අවුරුදු කාලසීමාවක් ධුර දැරිය යුතු අතර නැවත නම් කරනු ලැබීමට ඔවුහු සුදුසු වන්නාහ.

(4) මණ්ඩලයෙහි සභාපති හෝ නම් කරනු ලැබූ වෙන යම් සාමාජිකයකු—

(අ) (2) වන උපවගන්තියෙහි සඳහන් නුසුදුසුකමට භාජන වුවහොත් ; හෝ

(ආ) කායික දුබලතාව හෝ සිහිවිකලතාව හේතුකොට ගෙන සිය යුතුකම් ඉටු කිරීමට ස්ථිර වශයෙන් අපොහොසත් බවට පත් වුවහොත් ; හෝ

(ඇ) මණ්ඩලය අපකීර්තියට පත්වීමට හේතු විය හැකි යයි අමාත්‍යවරයා අදහස් කරන යම් ක්‍රියාවක් හෝ දෙයක් කර ඇතහොත්

අග්‍රාමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් ඔහු ධුරයෙන් ඉවත් කළ හැකි ය.

(5) මණ්ඩලයෙහි සභාපති හෝ නම් කරනු ලැබූ වෙන යම් සාමාජිකයකු ධුරය අත් හැරියහොත් හෝ ඉහත කී උපවගන්තියෙහි විධිවිධාන යටතේ ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් ඔහුගේ ධුර කාලයෙන් ගත නොවී ඇති කොටස තුළ ඔහු වෙනුවෙන් ධුරය දැරීමට අග්‍රාමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් වෙනත් තැනැත්තකු නම් කළ යුතු ය.

(6) මණ්ඩලයෙහි සභාපති හෝ නම් කරනු ලැබූ වෙන යම් සාමාජිකයකු අසනීප වීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙන යම් කරුණක් නිසා හෝ ස්වකීය ධුරයෙහි යුතුකම් ඉටු කිරීමට තාවකාලිකව අපොහොසත් වුවහොත් සභාපති වශයෙන් හෝ සාමාජිකයකු වශයෙන් ඔහු වෙනුවෙන් වැඩ බැලීමට අග්‍රාමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් වෙන යම් තැනැත්තකු නම් කළ හැකි ය.

(7) මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයෙන් සහ ප්‍රමාණයන් අනුව මණ්ඩලයෙහි සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවිය යුතු අතර එපරිද්දෙන් ම නිශ්චය කරනු ලැබිය හැකි වෙනත් සේවා කොන්දේසිවලට ඔවුන් යටත් විය යුතු ය.

(8) මණ්ඩලයේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීම හෝ එහි සාමාජිකයකු නම් කිරීමේ යම් අඩුපාඩුවක් තිබීම පමණක් හේතුකොට ගෙන මණ්ඩලයෙහි කිසිම ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු නො විය යුතු ය.

7. (1) මණ්ඩලයේ රැස්වීම් සභාපති විසින් කැඳවනු ලැබිය යුතු අතර, මේ පනත යටතේ මණ්ඩලයෙහි වගකීම් ඉටුකිරීමේ කාර්යය සඳහා අවශ්‍ය වන රැස්වීම් ගණනක් පවත්වනු ලැබිය යුතු ය. මණ්ඩලයේ රැස්වීම්.

(2) මණ්ඩලයෙහි යම් රැස්වීමක ගණපූරණය සාමාජිකයන් පස් දෙනකුගෙන් සමන්විත වේ.

(3) මණ්ඩලය විසින් මණ්ඩලයේ රැස්වීම්වල වාර්තා සටහන් කරනු ලැබීමට සැලැස්විය යුතු අතර ඒ වාර්තාවල පිටපත් මණ්ඩලය විසින් අමාත්‍යවරයා වෙත යැවිය යුතු ය.

8. (1) නිසි ලෙස මණ්ඩලයේ බලතල ක්‍රියාවෙහි යෙදවීම සහ කාර්යයන් කිරීම ද යුතුකම් ඉටු කිරීම ද සඳහා අවශ්‍ය දෙපාර්තමේන්තු හෝ අංශ මණ්ඩලය විසින් පිහිටුවිය හැකි ය. මණ්ඩලයේ විශේෂ බලතල.

(2) කාර්යක්ෂම ලෙස මණ්ඩලයේ බලතල ක්‍රියාවෙහි යෙදවීම සහ කාර්යයන් කිරීම ද යුතුකම් ඉටු කිරීම ද සඳහා අවශ්‍ය යයි මණ්ඩලය විසින් සලකනු ලබන නිලධරයන් හා සේවකයන් මණ්ඩලය විසින් පත් කළ හැකි අතර මණ්ඩලය විසින් කලින් කල නිශ්චය කරනු ලබන වැටුප් හා දීමනා ඔවුන්ට ගෙවීම ද මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන සේවා කොන්දේසි ඔවුන් සඳහා නියම කිරීම ද මණ්ඩලය විසින් කළ හැකි ය.

(3) මණ්ඩලයේ නිලධරයන්ගේ හා සේවකයන්ගේ ද ඔවුන් ගෙන් යැපෙන්නන්ගේ හා ඔවුන්ගේ නාමිතයන්ගේ ද යහපත උදෙසා අර්ථසාධක අරමුදලක්, වෛද්‍ය ආධාර යෝජනා ක්‍රම, ණය යෝජනා ක්‍රම සහ වෙනත් සුභසාධක යෝජනා ක්‍රම මණ්ඩලය විසින්, අමාත්‍යවරයාගේ අනුමතිය හා මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, පිහිටුවා පිහිටුවීමත් කළ හැකි අතර, ඒ කිසියම් අරමුදලකට හෝ යෝජනා ක්‍රමයකට මණ්ඩලය විසින් දායක මුදල් ගෙවිය හැකි ය.

තේ කොමසාරිස් පත් කිරීම සහ තේ පාලක හා තේ අපනයන කොමසාරිස් යන තනතුරු ආලෝපනය කිරීම.

9. (1) මේ පනතෙහි කාර්යයන් සඳහා තේ කොමසාරිස් වශයෙන් හෝ එසේ ක්‍රියා කිරීමට හෝ නමින් නැතහොත් නිලයෙන් යම් තැනැත්තකු පත් කළ හැකි අතර මේ පනතෙහි හෝ වෙන යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව ඔහු පහත සඳහන් කටයුතු කළ යුතු ය:—

(අ) වෙන යම් ලිඛිත නීතියක් යටතේ තේ පාලක වෙත පැවරී ඇති හා ඔහුට නියම වී ඇති බලතල ක්‍රියාවෙහි යෙදවීම, කාර්යයන් කිරීම සහ යුතුකම් ඉටු කිරීම;

(ආ) වෙන යම් ලිඛිත නීතියක් යටතේ තේ අපනයන කොමසාරිස් වෙත පැවරී ඇති හා ඔහුට නියම වී ඇති බලතල ක්‍රියාවෙහි යෙදවීම, කාර්යයන් කිරීම සහ යුතුකම් ඉටු කිරීම; සහ

(ඇ) මණ්ඩලය විසින් තමා වෙත පවරනු ලබන වෙන යම් කාර්යයන් සහ යුතුකම් ඉටු කිරීම.

(2) තේ පාලක තනතුර සහ තේ අපනයන කොමසාරිස් තනතුර මෙයින් ආලෝපනය කරනු ලබන අතර ඒ අනුව ඒ තනතුරුවල පැවැත්ම අවසන් වන්නේ ය.

රාජ්‍ය නිලධරයන් පත් කිරීම.

10. (1) 20 වන වගන්තිය අදාළ වන නිලධරයකු නොවන රාජ්‍ය සේවයෙහි යම් නිලධරයකු, මණ්ඩලයේ ඉල්ලීම පිට, ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්ගේ කැමැත්ත ඇතිව, එමැනි ම කැමැත්ත ඇතිව මණ්ඩලය විසින් නිශ්චය කළ හැකි කාලසීමාවක් සඳහා, මණ්ඩලයෙහි කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකිය; නැතහොත්, ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ මණ්ඩලයෙහි කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ රාජ්‍ය සේවයෙහි යම් නිලධරයකු සම්බන්ධයෙන්, 1957 අංක 48 දරන මෝටර් ගමනාගමන පනතේ 9 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ වන අතර, එකී (1) වන උපවගන්තිය යටතේ ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත්

කරනු ලැබූ රාජ්‍ය සේවයෙහි යම් නිලධරයකු සම්බන්ධයෙන් ඉහත කී 9 වන වගන්තියේ (3) වන උපවගන්තියෙහි විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ වන්නේ ය.

(3) නිශ්චිත කාලසීමාවක් ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වෙමින් ආණ්ඩුව සමඟ ගිවිසුමකට එළඹ සිටින යම් තැනැත්තකු මණ්ඩලය විසින් සේවයෙහි යොදවා ගනු ලබන විට ඒ තැනැත්තා විසින් මණ්ඩලයට සේවය කරනු ලබන යම් කාලසීමාවක් ඒ ගිවිසුමෙහි බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරනු ලබන සේවය ලෙස සලකනු ලැබිය යුතු ය.

**11.** මණ්ඩලයෙහි සියලු ම නිලධරයන් හා සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයෙහි අර්ථානුකූලව සහ එහි කාර්යයන් සඳහා රාජ්‍ය නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

මණ්ඩලයෙහි නිලධරයන් හා සේවකයන් රාජ්‍ය නිලධරයන් ලෙස සැලකෙන බව.

**12.** අල්ලස් පනතෙහි අර්ථානුකූලව මණ්ඩලය උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතෙහි විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

අල්ලස් පනතෙහි අර්ථානුකූලව මණ්ඩලය උපලේඛනගත ආයතනයක් ලෙස සැලකෙන බව.

**13.** (1) (අ) ශ්‍රී ලංකාවෙන් අපනයනය කෙරෙන සෑම තේ රාත්තල් සියයක් සඳහා රුපියල් දහයයි ශත හැට පහක් බැගින් ගණන් බලනු ලබන සෙස් බද්දක් අය කළ යුතු හා ලබා ගත යුතු අතර එය ගෙවනු ලැබිය යුතු ය :

තේ සඳහා සෙස් බද්දක් අය කිරීම.

එසේ වුව ද නැවත අපනයනය කිරීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද බව ප්‍රධාන අයකැමි සෑහීමට පත් වන පරිදි ඔප්පු කරනු ලබන තේ කිසිවක් සඳහා ඒ සෙස් බද්ද අය කිරීම හෝ ලබා ගැනීම නොකළ යුතු ය.

(ආ) මේ වගන්තියෙන් නියම කරනු ලැබූ සෙස් බද්දේ ප්‍රමාණය වෙනස් කිරීම හෝ ඒ බද්ද පරිච්ඡින්න කිරීම අමාත්‍යවරයා විසින් කරනු ලබන නියමයක් මගින් කළ හැකි ය. ඒ නියමය ගැසට් පත්‍රයෙහි පළ කළ යුතු අතර, එසේ පළ කරනු ලබන දිනයෙහි එය වලංගු වන්නේ ය.

(ඇ) මේ උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් කරනු ලැබූ සෑම නියමයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් මාස හතරක් ඇතුළත අනුමතිය සඳහා ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ එකී යම් නියමයක් අනනුමතියේ දින සිට ප්‍රත්‍යාදිෂ්ට වූ ලෙස සලකනු ලැබිය යුතු නමුදු එය යටතේ කලින් කරන ලද යම් දෙයක වලංගු භාවයට ඉන් හානියක් නොවන්නේ ය.

(ඈ) මේ වගන්තිය රේගු ආඥාපනතෙහි කොටසක් ලෙස බල පැවැත්විය යුතු අතර, ඒ ආඥාපනතෙහි විධිවිධාන ඒ අනුව අදාළ වන්නේ ය.

2—ජ 11331 (74/12)

(ඉ) මේ වගන්තිය යටතේ අය කර ගනු ලබන තේ සෙස් බද්දෙන් ලැබෙන මුදල් ප්‍රධාන තේ අරමුදලෙහි බැරට ප්‍රධාන අයකැමි විසින් මාස්පතා ගෙවිය යුතු ය.

(ඊ) තේ වෙනුවෙන් මේ වගන්තිය යටතේ පනවනු ලැබූ සෙස් බද්ද තේ වෙනුවෙන් වෙන යම් ලිඛිත නීතියක් යටතේ අය කෙරෙන යම් අපනයන තීරු බද්දකට අතිරේකව විය යුතු ය.

ප්‍රාග්ධන අරමුදල.

**14.** (1) "ප්‍රාග්ධන අරමුදල" යනුවෙන් නම් කරනු ලබන අරමුදලක් පිහිටුවනු ලබන අතර, පහත සඳහන් මුදල් ඒ අරමුදලට ගෙවිය යුතුය :—

(අ) නියමිත දිනයෙහි තේ පාලන අරමුදලෙහි බැරට ඇති යම් ශුද්ධ වත්කම්වල වටිනාකම;

(ආ) නියමිත දිනයෙහි තේ සහනාධාර අරමුදලෙහි බැරට ඇති යම් ශුද්ධ වත්කම්වල වටිනාකම;

(ඇ) නියමිත දිනයෙහි ලංකා තේ ප්‍රචාරක මණ්ඩලයෙහි බැරව ඇති යම් ශුද්ධ වත්කම්වල වටිනාකම;

(ඈ) නියමිත දිනයෙහි තේ පර්යේෂණ මණ්ඩලයේ බැරට ඇති යම් ශුද්ධ වත්කම්වල වටිනාකම;

(ඉ) ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක්, රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් විසින්, ඒ දෙපාර්තමේන්තුව හෝ සංස්ථාව භාර අමාත්‍යවරයාගේ නැතහොත් පළාත් පාලන ආයතනයක් නම් පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයාගේ නියමයක් අනුව නැතහොත් ඔහුගේ අනුමතිය ඇතිව, මණ්ඩලය වෙත පවරා දෙනු ලබන ශුද්ධ වත්කම් කිසිවක් වේ නම් එම ශුද්ධ වත්කම්වල වටිනාකම; සහ

(ඊ) (i) මේ පනත යටතේ තේ විෂයෙහි පනවනු ලැබූ සියලු සෙස් බදුවලින් ද,

(ii) මේ පනත යටතේ හෝ 1957 අංක 51 දරන තේ පාලන පනත යටතේ හෝ 1959 අංක 16 දරන තේ (බදු හා අපනයන පාලන) පනත යටතේ නිකුත් කරනු ලබන බලපත්‍ර හා අවසර පත්‍ර සම්බන්ධයෙන් හෝ වෙනයම් ලිඛිත නීතියක් යටතේ තේ ගනු දෙනු සම්බන්ධයෙන් අයකර ගනු ලබන සියලු ගාස්තුවලින් ද,

(iii) තේ කොමසාරිස් විසින් තේ ඇට, කැපූ රිකිලි, පැල සහ පොහොර වර්ග තේ වතු හා කුඩා තේ ඉඩම් අයිතිකරුවන්ට විකිණීමෙන් ද

ලැබෙන මුදල් ;

(ඖ) මේ පනතෙහි කාර්යයන් සඳහා විසර්ජන පනත මගින් කලින් කල අනුමත කරනු ලබන මුදල් හෝ ජාතික රාජ්‍ය සභාවෙහි යෝජනා සම්මතයෙන් කලින් කල අනුමත කරනු ලැබිය හැකි මුදල් ;

(ඍ) 1957 අංක 51 දරන තේ පාලන පනත යටතේ හෝ 1959 අංක 16 දරන තේ (බදු හා අපනයන පාලන) පනත යටතේ හෝ වැරදි සමථයට පත් කිරීමෙන් තේ කොමසාරිස් විසින් ලබන්නා වූ සියලු මුදල් ; හා

(එ) මණ්ඩලයට අයිති දේපළ විකිණීමෙන් ලැබෙන අන් සියලු මුදල්, තෑගි හා ආයෝජනවලින් හෝ අන් ලෙසකින් ලැබෙන ආදායම්.

(2) පහත සඳහන් ගෙවීම් ද ඇතුළුව, මේ පනත යටතේ මණ්ඩලයේ බලතල ක්‍රියාවෙහි යෙදවීමේ දී, කාර්යයන් කිරීමේ දී හා යුතුකම් ඉටු කිරීමේ දී දරනු ලබන වියදම් පියවීමේ කාර්යය සඳහා, මණ්ඩලය විසින් අනුමත කරනු ලැබිය හැකි මුදල් ප්‍රාග්ධන අරමුදලින් ගෙවිය යුතු ය :—

(i) මේ පනතෙහි විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා මණ්ඩලය විසින් සේවයෙහි යොදවනු ලබන සියලු නිලධරයන්ගේ හා සේවකයන්ගේ පාරිශ්‍රමික සහ මේ පනතෙහි කාර්ය පරිපාලනය සඳහා දරනු ලබන වෙනත් සියලු වියදම් ;

(ii) තේ වගා කිරීම පිණිසත් වතු හා කුඩා ඉඩම් නැවත වගා කිරීම හා පුනරුත්ථාපනය කිරීම පිණිසත්, තේ වතුවල හා කුඩා ඉඩම්වල තේ වෙනුවට වෙනත් බෝග වර්ග වැවීමෙන් හෝ සත්ව ගොවිපොලවල් පිහිටුවීමෙන් ඒ වතු සහ කුඩා ඉඩම් නානාංගකරණය කිරීම පිණිසත්, තේ වතුවල සහ කුඩා ඉඩම්වල අමු තේ දළු අලෙවි කිරීම පිණිසත් සෑදූ තේ හෝ ක්ෂණික තේ නිෂ්පාදනය කිරීම පිණිසත් ප්‍රදාන හෝ ණය වශයෙන් මුදලින් ආධාර සැපයීමේ කාර්යය සඳහා මණ්ඩලය විසින් අනුමත කරනු ලබන මුදල් ;

(iii) තේ වතු හා කුඩා තේ ඉඩම් අයිතිකරුවන්ට, තේ නිෂ්පාදකයන්ට සහ තේ වෙළෙඳුන්ට උපදේශක සේවා ලබාදීම සඳහා මණ්ඩලය විසින් අනුමත කරනු ලබන මුදල් ;

(iv) ජාත්‍යන්තර තේ කාරක සභාවෙහි හෝ තේ හා සම්බන්ධ ප්‍රශ්න පිළිබඳව ක්‍රියා කරන වෙන යම් ජාත්‍යන්තර සංවිධානයක ශ්‍රී ලංකාවේ සාමාජිකත්වය පිළිබඳව දරනු ලැබිය හැකි වියදම්.

**1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ විධිවිධාන අදාළ කිරීම.**

**15.** (1) 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිත ව, මණ්ඩලයේ මුදල් පාලන යට සහ ගිණුම්වලට අදාළ වන්නේ ය.

(2) මණ්ඩලයේ සහ 8 වන වගන්තිය යටතේ පිහිටුවන ලද එක් එක් දෙපාර්තමේන්තුවේ හෝ අංශයේ මුදල් වර්ෂය, එක් එක් වර්ෂයේ ජනවාරි මස පළමුවැනි දිනෙන් ආරම්භ වන දොළොස් මසක කාල පරිච්ඡේදය වන්නේ ය.

**මණ්ඩලයේ විශේෂ යුතුකම.**

**16.** තේ කර්මාන්තයෙහි තත්ත්වය සහ කම්කරුවන්ගේ සාමාන්‍ය ශුභ සිද්ධිය පිළිබඳ වාර්තා ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කිරීම පහසුවීම පිණිස, කම්කරුවන්ගේ අවම සේවා හා ජීවන තත්ත්වයන් කෙරෙහි විශේෂ අවධානය දක්වමින් එයි කරුණු පිළිබඳ වාර්තා අමාත්‍යවරයා වෙත කලින් කල ඉදිරිපත් කිරීම මණ්ඩලයේ යුතුකම විය යුතු ය.

**මණ්ඩලයේ යම් කාර්යයක් සඳහා දේපළ අත්කර ගැනීම.**

**17.** (1) මණ්ඩලයේ යම් කාර්යයක් සඳහා යම් නිශ්චල දේපළක් අත්කර ගැනීම අවශ්‍ය වී එම යෝජිත අත්කර ගැනීම අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයකින් අනුමත කරනු ලැබූ අවස්ථාවක, එම දේපළ පොදු කාර්යයක් සඳහා අවශ්‍ය වී ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ එය අත්කර ගනු ලැබ මණ්ඩලයට පවරනු ලැබිය හැකි ය.

(2) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ යම් නිශ්චල දේපළක් මණ්ඩලය සඳහා අත්කර ගැනීම සම්බන්ධයෙන් ගෙවිය යුතු වන යම් මුදලක් ප්‍රාග්ධන අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**තේ පාලන දෙපාර්තමේන්තු වේයි සියලු දේපළ මණ්ඩලය වෙත පැවරීම.**

**18.** (1) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයෙහි තේ පාලන දෙපාර්තමේන්තුව සතුව තිබූ සියලු චංචල හෝ නිශ්චල දේපළ ද දේපළ පිළිබඳ වූ සියලු අයිතිවාසිකම් ද ඒ දිනයෙහි මණ්ඩලය වෙත පැවරිය යුතු වන් සේ ඒවා මණ්ඩලයෙහි දේපළ හා අයිතිවාසිකම් වන්නේ ය.

(2) තේ පාලක විසින් නීත්‍යනුකූලව ඇතුළත් වුණු ගිවිසුම් යටතේ ඇත්තා වූ ද නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයෙහි පවත්නා වූද ඔහුගේ සියලු අයිතිවාසිකම් හා බැදීම් ඒ දිනයෙහි මණ්ඩලයේ අයිතිවාසිකම් හා බැදීම් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

(3) තේ පාලන දෙපාර්තමේන්තුවේ සියලු වත්කම් සහ බැරකම්, නියමිත දිනයේ දී ඒ දෙපාර්තමේන්තුවේ ගිණුම් පොත්වල දැක්වෙන වටිනාකම අනුව, මණ්ඩලයේ වත්කම් හා බැරකම් වන්නේ ය.

1959 අංක 16 දරන පනත සංශෝධනය කිරීම.

**19.** 1959 අංක 16 දරන තේ (බදු හා අපනයන පාලන) පනත පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ පනතෙහි 9 වන වගන්තිය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කිරීමෙන් :—

" කොමසාරිස්ගේ තීරණයට, ප්‍රකාශයට හෝ නිශ්චය කිරීමට විරුද්ධව අභියාචනා කිරීම.

9. (1) මේ පනත යටතේ කොමසාරිස්ගේ යම් තීරණයකින්, ප්‍රකාශයකින් හෝ නිශ්චය කිරීමකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, ඒ තීරණය හෝ ඒ නිශ්චය කිරීම හෝ තමා වෙත දැනුම් දෙනු ලැබීමෙන් පසු දින දහහතරක් ඇතුළත නැතහොත් ප්‍රකාශයක් සම්බන්ධයෙන් වූ විට ඒ ප්‍රකාශය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු දින දහහතරක් ඇතුළත, ඒ තීරණයට, ප්‍රකාශයට හෝ නිශ්චය කිරීමට විරුද්ධ ව ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙත ලියවිල්ලකින් අභියාචනා කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරනු ලැබූ යම් අභියාචනයක් ගැන තීරණය කිරීමට පෙර, ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින්, අභියාචනය කරන තැනැත්තා විසින් දක්වීමට අදහස් කරන කරුණු පෞද්ගලිකව ම හෝ ඔහුගේ නියෝජිතයා මගින් මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමේ අවස්ථාව, ඒ තැනැත්තා හට දිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ කරනු ලැබූ යම් අභියාචනයක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තීරණය අවසානාත්මක වන අතර යම් අධිකරණයක දී එය ප්‍රශ්න නොකළ යුතු ය. ";

(2) ඒ පනතෙහි 13 වන වගන්තිය ඉවත් කිරීමෙන් ;

(3) ඒ පනතෙහි 15 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

" (1) පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් නියෝග සෑදිය හැකිය :—

(අ) නියම කරනු ලැබීමට මේ පනත මගින් නියමිත සියලු කරුණු ;

(ආ) මේ පනතෙහි විධිවිධාන ක්‍රියාවේ යෙදීමෙහි නියුක්ත තැනැත්තන් හට දීමනා ගෙවීම ;

(ඈ) 9 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලැබූ අභියාචනා විභාග කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය; සහ

(ඉ) මේ පනතෙහි විධිවිධාන ක්‍රියාවේ යෙදීම සඳහා අවශ්‍ය සියලු කරුණු.";

(4) ඒ පනතේ 19 වන වගන්තිය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කිරීමෙන් :—

"වැරදි සමථයට පත්කිරීම.

19. ප්‍රමාණවත් යයි කොමසාරිස් විසින් සලකනු ලබන මුදලක් වරදකරුගෙන් භාර ගැනීමෙන් මේ පනත යටතේ වූ යම් වරදක් සමථයට පත් කිරීම කොමසාරිස් විසින් කළ හැකි ය. මේ පනත යටතේ කොමසාරිස් විසින් භාරගනු ලබන සියලු මුදල් ප්‍රාග්ධන අරමුදලට බැර කළ යුතු ය.";

(5) 22 වන වගන්තියෙහි—

(අ) "අනුමත වත්ත" යන පාඨයෙහි අර්ථකථනයට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

' "ප්‍රාග්ධන අරමුදල" යන්නෙන් ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ පිහිටුවනු ලැබූ ප්‍රාග්ධන අරමුදල අදහස් වේ;' සහ

(ආ) "කොමසාරිස්" යන පාඨයෙහි අර්ථකථනය වෙනුවට පහත දැක්වෙන අලුත් අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

' "කොමසාරිස්" යන්නෙන් තේ කොමසාරිස් ධුරය තත් කාලයෙහි දරන තැනැත්තා අදහස් වේ;'.

ඇතැම් රාජ්‍ය නිලධරයන්ට අදාළ විශේෂ විධිවිධාන.

20. (1) 1957 අංක 51 දරන තේ පාලන පනතෙහි හෝ 1958 අංක 12 දරන තේ සහනාධාර පනතෙහි හෝ 1959 අංක 16 දරන තේ (බදු සහ අපනයන පාලන) පනතෙහි කාර්ය පරිපාලනය සඳහා සේවයේ යොදවනු ලැබූ, ආණ්ඩුවේ ස්ථාන මාරු සහිත සේවයේ නිලධරයකු නොවන, සෑම රාජ්‍ය නිලධරයකු සම්බන්ධයෙන්ම මේ වගන්තියෙහි විධිවිධාන අදාළ වන්නේ ය.

(2) (1) වන උපවගන්තිය අදාළ වන්නා වූ ද විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් වශයෙන් ප්‍රකාශිත තනතුරක් දරන්නා වූ ද සෑම රාජ්‍ය නිලධරයකු ම නියමිත දිනයේ දී—

(අ) රාජ්‍ය සේවයෙන් අස් වී 21 (1) වන වගන්තිය අනුව මණ්ඩලය යටතේ රක්ෂාවක් ලබා ගැනීමට; හෝ

(ආ) රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලබා 21 (2) වන වගන්තිය අනුව මණ්ඩලය යටතේ රක්ෂාවක් ලබා ගැනීමට; හෝ

(ඇ) රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගැනීමට සහ මණ්ඩලය යටතේ රක්ෂාවක් ලබා නොගැනීමට

තමා අදහස් කරන බව අවස්ථාවෝචිත පරිදි තේ පාලකට හෝ තේ අපනයන කොමසාරිස්ට ලිඛිත දැන්වීමකින් නියමිත දිනට කලින් දැනුම් දිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් වන රාජ්‍ය නිලධරයකු විසින්, නියමිත දිනයට කලින්, අවස්ථාවෝචිත පරිදි, තේ පාලකට හෝ තේ අපනයන කොමසාරිස්ට එම උපවගන්තිය යටතේ කරන ලද දැන්වීමක් අවසානාත්මක වන්නේ ය.

20 වන වගන්තිය යටතේ දැන්වීම් කරන රාජ්‍ය නිලධරයන් සම්බන්ධයෙන් විධිවිධාන.

**21.** (1) 20 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් වූ ද එම උපවගන්තියේ (අ) ඡේදය යටතේ නියමිත දිනයට කලින් දැන්වීමක් කරන්නා වූ ද යම් රාජ්‍ය නිලධරයකු සම්බන්ධයෙන් වූ විට,—

(අ) මණ්ඩලය යටතේ සේවයේ යෙදී සිටින කාලය තුළ දී මණ්ඩලයේ කාර්ය මණ්ඩලයේ අන් කිසි සාමාජිකයකු යටත් වන විනය පාලනයටම ඔහු යටත් වන්නේ ය;

(ආ) මණ්ඩලය යටතේ සේවයේ යෙදී සිටින කාලය තුළදී පාරිශ්‍රමික, නිවාඩු, නිවාඩු ගමන් බලපත්‍ර සහ අතිකුත් සේවා තත්ත්වයන් සම්බන්ධයෙන් නියමිත දිනයට පෙරාතුවම වූ කාලයේ දී ඔහු හිමිකම් ලබා සිටි සේවා නියමයන් හා කොන්දේසිවලට අඩු වාසි සහගත තත්ත්වයක් නොදරන සේවා නියමයන් හා කොන්දේසිවලට (අ) ඡේදයට යටත් ව, ඔහුට හිමිකම් ලැබෙන්නේ ය.

(ඇ) ඔහු මේ වගන්තිය අනුව මණ්ඩලය යටතේ සේවයෙහි යෙදී සිටින තාක් කල්, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් වශයෙන් ප්‍රකාශිත රාජ්‍ය සේවා තනතුරක දිගටම සේවයෙහි යෙදී සිටින ලෙස එම ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්යයන් සඳහා සලකනු ලැබිය යුතු අතර මණ්ඩලය යටතේ කරන සේවය රජය යටතේ කරන සේවය වශයෙන් සලකනු ලැබ විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් ඔහුට ප්‍රදානය කරනු ලැබීමට ඔහුට හිමිකම් ලැබෙන්නේ ය; තව ද එම විශ්‍රාම වැටුප හෝ පාරිතෝෂිකය, රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යවරයා විසින් එකී ව්‍යවස්ථා සංග්‍රහය අනුව, ප්‍රදානය කරනු ලැබිය හැකි ය;

(ඈ) මණ්ඩලය යටතේ සේවයෙහි යෙදී සිටින සෑම සම්පූර්ණ මාසයක් ම වෙනුවෙන් මණ්ඩලය යටතේ සේවයේ ඔහු දරන තනතුරේ වැටුපෙන්, රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන අන්දමේ යම් කොටසක්, ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබීම සඳහා විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ වෙත මණ්ඩලයේ අරමුදලින් ඔහු සම්බන්ධයෙන් ගෙවනු ලැබිය යුතු ය;

(ඉ) මණ්ඩලය යටතේ සේවයෙහි යෙදී සිටින තාක් කල්, වැන්දඹු හා අනාත් දරු විශ්‍රාම වැටුප් අරමුදල් ආඥාපනතේ කුමක් සඳහන්ව ඇත ද, එම ආඥාපනතේ අර්ථානුකූලව සහ එකී විධිවිධාන අදාළ කිරීමේ කාර්යය සඳහා ඔහු රාජ්‍ය නිලධරයකු වශයෙන් සලකනු ලබන්නේ ය;

(ඊ) මණ්ඩලය යටතේ සේවය කරමින් සිටින කාලය තුළ යම් අවස්ථාවක (2) වන උපවගන්තියට අනුකූලව මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තමා පත් කරනු ලැබීමට ඔහු විසින් තෝරා ගනු ලැබිය හැකි අතර, ඒ තෝරා ගැනීම කළ විට,—

(i) මේ වගන්තිය අනුව ඔහු මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට පත් කරනු ලැබූ දිනයේ දී අයහපත් සෞඛ්‍ය තත්ත්වය නිසා රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගන්වනු ලැබුවේ නම් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔහුට ප්‍රදානය කළ හැකිව තිබුණු ප්‍රමාණයේ දීමනාවක් ලැබීමට ඔහුට සුදුසුකම් ලැබෙන්නේය; තව ද මණ්ඩලයේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් වූ ඔහුගේ සේවය, වයස්ගතවීම හෝ අයහපත් සෞඛ්‍ය තත්ත්වය හේතුකොට ගෙන විශ්‍රාම ගැනීම නිසා හෝ ඒ කාර්ය මණ්ඩලයේ ඔහු දරූ තනතුර අහෝසි කරනු ලැබීම නිසා හෝ රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන වෙනත් යම් කරුණක් නිසා හෝ අවසාන කරනු ලැබුව හොත් මිස විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ දෙනු ලබන එවැනි දීමනාවක් ඔහුට ගෙවනු නො ලැබේ; තව ද,

(ii) මේ වගන්තිය අනුව මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට පත් කරනු ලැබීමෙන් පසු ඔහු මිය ගියහොත්, මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට පත් කරනු ලැබීමට පෙරාතුව ම ඔහු මිය ගියේ නම් ඔහු වෙනුවෙන් ඒ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය හැකිව තිබුණු දීමනාව ඔහු වෙනුවෙන් ගෙවනු ලැබේ.

(2) 20 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ දැන්වීමක් නියමිත දිනයට කලින් කරන්නා වූ ද එම උපවගන්තියේ සඳහන් වන්නා වූ ද යම් රාජ්‍ය නිලධරයෙක්—

(අ) නියමිත දිනයේ දී රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලැබූ ලෙස සලකනු ලබන්නේය;

(ආ) එම නිලධරයා සහ මණ්ඩලය එකඟත්වයට පත් වන නියමයන් හා කොන්දේසි මත සේවයේ යොදවා ගනු ලබන්නේය:

එසේ වුව ද ඒ නියමයන් හා කොන්දේසි 1057 අංක 51 දරන තේ පාලන පනතෙහි, 1958 අංක 12 දරන තේ සහනාධාර පනතෙහි හෝ 1959 අංක 16 දරන තේ (බදු සහ අපනයන පාලන) පනතෙහි කාර්ය පරිපාලනය සඳහා එම සේවකයා සේවයේ යොදවා ගනු ලැබීමේදී යටත්වූ නියමයන් හා කොන්දේසිවලට අඩු වාසි සහගත තත්ත්වයක් නොදැරිය යුතු ය;

(ඇ) එම දිනයේ දී ධුරය අහෝසි කරනු ලැබීමේ හේතුව උඩ විශ්‍රාම ගත්තේ නම් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔහුට ප්‍රදානය කළ හැකිව තිබුණු විශ්‍රාම වැටුප හෝ පාරිතෝෂික දීමනාව ලැබීමට ඔහු සුදුසුකම් ලබන්නේය;

(ඇ) විශ්‍රාම වැටුප් ලැබීමට සුදුසුකම් ලැබ සිටිත හොත් සහ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2අ (1) (i) වන වගන්තිය යටතේ වූ තෝරාගැනීම නොකරත හොත් මණ්ඩලය යටතේ සේවයෙහි යෙදී සිටින කාලය සඳහා ඔහුට විශ්‍රාම වැටුප් ගෙවනු නොලැබිය යුතු ය;

(ඉ) විශ්‍රාම වැටුපක් ලැබීමට සුදුසුකම් ලබා ඇති නම් සහ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2අ (1) (i) වන වගන්තියේ විධිවිධානවලට අනුව තමාගේ විශ්‍රාම වැටුපෙන් හතරෙන් එක කොටසක් අර්ධ පරිවර්තිත පාරිතෝෂිකයක් වශයෙන් ලබා ගැනීමට කැමැත්ත දක්වන්නේ නම්—

(අඅ) එම පාරිතෝෂිකය ඔහුට ගෙවනු නොලැබිය යුතු අතර, මේ පනත යටතේ පිහිටුවන ලද මණ්ඩලයේ අර්ථසාධක අරමුදලක ඔහුගේ ගිණුමට එය බැර කරනු ලැබිය යුතු ය;

(ආආ) එකී ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔහුට ගෙවනු ලැබිය යුතු විශ්‍රාම වැටුපේ ඉතිරි හතරෙන් තුන් පංගුව ඔහු මණ්ඩලය යටතේ සේවයෙහි යෙදී සිටින කාලය තුළ දී ඔහුට ගෙවනු නොලැබිය යුතුය;

(ඇඇ) එකී ව්‍යවස්ථා සංග්‍රහයේ 2අ (1) (i) වන වගන්තියේ සඳහන් "විශ්‍රාම ගන්නා දින සිට අවුරුදු දොළහකුත් මාස හයක කාලය" ගණන් බැලීමේ කාර්යය සඳහා මණ්ඩලය යටතේ ඔහු සේවය කළ අවසාන දිනයට පසු දිනය ඔහු විශ්‍රාම ගත් දිනය වශයෙන් සලකනු ලැබිය යුතු ය; තව ද

(ඊ) විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔහුට සුදුසුකම් ලැබී ඇත්තේ විශ්‍රාම වැටුපක් ලැබීමට නොව පාරිතෝෂිකයක් ලැබීමට නම් එම පාරිතෝෂිකය ඔහුට ගෙවනු නොලැබිය යුතු අතර මේ පනත යටතේ පිහිටුවනු ලබන මණ්ඩලයේ අර්ථසාධක අරමුදලක ඔහුගේ ගිණුමට එය බැර කරනු ලැබිය යුතු ය.

(3) 20 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් වන්නා වූ හා එම උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ වූ දැන්වීමක් නියමිත දිනයට කලින් කරන්නා වූ ද යම් රාජ්‍ය නිලධරයකු එම දිනයෙහි රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ධුරය අහෝසි කරනු ලැබීමේ හේතුව නිසා ඔහු රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගන්වනු ලැබුවේ නම් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔහුට ප්‍රදානය කළ හැකිව තිබුණු ප්‍රමාණයේ විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් ලැබීමට ඔහු සුදුසුකම් ලබන්නේ ය.

22. 1957 අංක 51 දරන තේ පාලන පනතෙහි හෝ 1959 අංක 16 දරන තේ (බදු සහ අපනයන පාලන) පනතෙහි හෝ කාර්ය පරිපාලනය සඳහා නියමිත දිනයේ දී සේවයේ යොදවා ගනු ලැබ සිටින යම් රාජ්‍ය නිලධරයකු ඔහුගේ සේවය සඳහා පාරිතෝෂිකයක් වශයෙන් ආණ්ඩුවෙන් ලැබ තිබිය හැකි සියලු මුදල් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් විසින් නියම කරනු ලබන පොලියකුත් සමග

විශ්‍රාම වැටුප් හිමි සේවය ගණන් බැලීම.

භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්ට ගෙවන හොත් හෝ ගෙවීමට එකඟ වෙතහොත් එම පාරිතෝෂිකය භාර ගැනීමටත් ඉන් පසු සේවය පමණක් විශ්‍රාම වැටුප් හිමි සේවය වශයෙන් ගණන් ගනු ලැබීමටත් වෙනස් නොකළ හැකි තෝරා ගැනීමක් එම රාජ්‍ය නිලධරයා විසින් 1963 දී කර තිබුණ ද එය නොතකා, තමා එසේ පාරිතෝෂිකයක් ලැබූ මුළු සේවය 20 වන වගන්තියේ (2) වන උපවගන්තියේ කාර්යයන් සඳහා විශ්‍රාම වැටුප් හිමි සේවය වශයෙන් ගණන් බලනු ලැබීමට ඔහුට හිමිකම් ලැබිය යුතු ය.

විශ්‍රාම වැටුප් ලබමින් සිටින තැනැත්තන් සම්බන්ධයෙන් විශේෂ විධිවිධාන.

23. වෙන යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, ආණ්ඩුවෙන් හෝ යම් පළාත් පාලන ආයතනයකින් හෝ පළාත් පාලන සේවා කොමිෂන් සභාවෙන් හෝ විශ්‍රාම වැටුපක් එවකටත් ලබමින් සිටින තැනැත්තකු මණ්ඩලය විසින් සේවයෙහි යොදවනු ලැබූ අවස්ථාවක, ඒ තැනැත්තා මණ්ඩලය විසින් සේවයෙහි යොදවා ගනු ලැබ සිටින කාල සීමාව තුළ ඔහුට ඒ විශ්‍රාම වැටුප් ගෙවනු නොලැබිය යුතු ය.

වැරදි.

24. මේ පනත යටතේ වරදක් කරන සෑම තැනැත්තෙක්ම, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, මාස හයකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ රුපියල් දහසකට නොවැඩි දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කරනු ලැබීම හා දඩය යන දෙකටම හෝ යටත් වන්නේ ය.

නියෝග.

25. (1) මේ පනතේ ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හා බල ගැන්වීමේ කාර්යය සඳහා මණ්ඩලය විසින් නියෝග සෑදිය හැකි ය.

(2) (1) වන උපවගන්තියෙන් පැවරුණු බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව මණ්ඩලය විසින් විශේෂයෙන්, පහත සඳහන් කරුණු සියල්ලක්ම හෝ ඉන් යමක් හෝ සම්බන්ධයෙන් නියෝග සෑදිය හැකි ය :—

(අ) වතු හා කුඩා ඉඩම් නැවත වගා කිරීම හා පුනරුත්ථාපනය කිරීම සඳහා ප්‍රාග්ධන අරමුදලේ මුදල්වලින් ආධාර දීමේ හා වතුවල හා කුඩා ඉඩම්වල තේ වැවීම වෙනුවට වෙනත් බෝග වර්ග වැවීමෙන් හෝ සතුන් ඇති කිරීමෙන් හෝ ඒ වතු හා කුඩා ඉඩම් නානාංගකරණය කිරීම සඳහා ඒ අරමුදලේ මුදල්වලින් ආධාර දීමේ යෝජනා ක්‍රමයක් ;

(ආ) තේ කර්මාන්තශාලා වැඩිදියුණු කිරීම, නවීකරණය හා ඉදි කිරීම සඳහා ඒ අරමුදලේ මුදල්වලින් ආධාරදීමේ යෝජනා ක්‍රමයක් ;

(ඇ) වතුවල හා කුඩා ඉඩම්වල තේ දළු අලෙවි කිරීම සඳහා ඒ අරමුදලේ මුදල්වලින් ආධාර දීමේ යෝජනා ක්‍රමයක් ;

(ඈ) තේ වෙන්දේසිය ඇතුළුව තේ විකිණීම විධිමත් කිරීමේ යෝජනා ක්‍රමයක් ;

(ඉ) තේ අපනයනය කිරීම ද පිටරටවල දී තේ වෙළඳාම් කිරීමේ දී, නැව් ගාස්තු, නැරැව් ගාස්තු, ගුදම් ගාස්තු හෝ වෙන යම් ගාස්තුවලට අදාළ කටයුතු හා ගෙවීම් ද විධිමත් කිරීමේ යෝජනා ක්‍රමයක් ;

(ඊ) ශ්‍රී ලංකාව ඇතුළත හා ඉන් පිටත තේ අලෙවි කිරීමට සහාය වීමේ හා ධෛර්ය දීමේ යෝජනා ක්‍රමයක් ;

(උ) ක්ෂණික තේ නිෂ්පාදනය කිරීමේ කර්මාන්තශාලා ඇතුළුව තේ කර්මාන්තශාලා පිහිටුවීම හා ක්‍රියා කරවීම විධිමත් කිරීමේ යෝජනා ක්‍රමයක් ;

(ඌ) මේ පනතේ කාර්යයන් සඳහා සේවයෙහි යොදවනු ලබන සියලුම හෝ යම් නිලධරයන් හා සේවකයන් ද ඔවුන්ගේ යැපෙන්නන් ද සඳහා අර්ථසාධක අරමුදල්, පාරිතෝෂික යෝජනා ක්‍රම, වෛද්‍යාධාර යෝජනා ක්‍රම සහ වෙනත් ශුභ සාධක යෝජනා ක්‍රම පිහිටුවීම හා විධිමත් කිරීම ;

(එ) නියෝග නිසි පරිදි ක්‍රියාත්මකවීම හා බලපැවැත්වීම නිසැක වම සිදුවීම පිණිස අවශ්‍ය විය හැකි යම් කොන්දේසි, තහනම් කිරීම් හෝ වෙනත් විධිවිධාන ;

(ඒ) එබඳු යම් නියෝගයක් කඩකිරීම හෝ එබඳු යම් නියෝගයක් අනුව ක්‍රියා කිරීම පැහැර හැරීම හා අසත්‍ය තොරතුරු හෝ වාර්තා මණ්ඩලය වෙත හෝ එහි නිලධරයන් හෝ සේවකයන් වෙත සැපයීම මහෙස්ත්‍රාත්වරයකු විසින් නඩු විභාගයකින් විභාග කළ හැකි වරදක් විය යුතු බවට, සහ ඒ වරද සඳහා දඹුවම රුපියල් දහසකට නොවැඩි දඩයක් හෝ මාස හයකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකම විය යුතු බවට විධිවිධාන සැලැස්වීම ;

(3) (අ) මණ්ඩලය විසින් සාදනු ලැබූ කිසිම නියෝගයක්, එය අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබුවහොත් මිස, වලංගු නොවන්නේ ය. අමාත්‍යවරයා විසින් එසේ අනුමත කරනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර එය එසේ පළ කරනු ලබන දිනයේ දී හෝ එහි නිශ්චිතව සඳහන් විය හැකි පසුව එළඹෙන දිනයක දී හෝ ක්‍රියාත්මක වන්නේ ය.

(ආ) මණ්ඩලය විසින් සාදනු ලැබ අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ සෑම නියෝගයක් ම, එය ගැසට් පත්‍රයෙහි පළ කිරීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතිය සඳහා ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක් ම අනනුමතියේ දින සිට පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු ය. එහෙත් එය යටතේ කලින් කරන ලද යම් දෙයක වලංගු භාවයට ඉන් හානියක් නොවන්නේ ය.

26. (1) තේ ප්‍රචාරක මණ්ඩල ආඥාපනත මෙයින් ඉවත් කරනු ලැබේ. තේ ප්‍රචාරක මණ්ඩල ආඥාපනත ඉවත් කිරීම හා ආනුෂංගික විධිවිධාන.

(2) නියමිත දිනට පෙරාතුව ම වූ දිනයෙහි ලංකා තේ ප්‍රචාරක මණ්ඩලය සතුව තුබූ සියලු චංචල හෝ නිශ්චල දේපළ සහ දේපළ පිළිබඳ සියලු අයිතිවාසිකම් එදින සිට මණ්ඩලය සතු වන අතර, ඒවා මණ්ඩලයේ දේපළ සහ අයිතිවාසිකම් වන්නේ ය.

(3) ලංකා තේ ප්‍රචාරක මණ්ඩලය නිත්‍යානුකූලව ඇතුළත් ව තිබී නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයෙහි වලංගුව පවතින ගිවිසුම් යටතේ ඒ මණ්ඩලය සතු සියලු අයිතිවාසිකම් හා බැඳීම් එදින සිට මණ්ඩලය සතු අයිතිවාසිකම් හා බැඳීම් ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) නියමිත දිනයට පෙරාතුවම වූ දිනයෙහි ලංකා තේ ප්‍රචාරක මණ්ඩලය යටතේ පත්වීමක් දරන සෑම නිලධරයකු හෝ සේවකයකුම එදින සිට මණ්ඩලයේ සේවයට මාරු කරනු ලැබිය යුතු ය.

(5) (4) වන උපවගන්තියේ විධිවිධාන යටතේ මාරු කරනු ලැබූ නිලධරයකු හෝ සේවකයකු, සමස්ත වශයෙන් ගත් කල නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයෙහි ලංකා තේ ප්‍රචාරක මණ්ඩලයේ වූ තම සේවයෙහි ලා ඔහු විසින් භුක්ති වින්දා වූ නියමයන්ට හා කොන්දේසිවලට අඩු වාසි සහගත තත්ත්වයක් නොදරන නියමයන් හා කොන්දේසි පිට, මණ්ඩලය විසින් සේවයෙහි යොදවා ගත යුතු ය.

(6) ලංකා තේ ප්‍රචාරක මණ්ඩලයේ සියලු වත්කම් හා බැරකම් නියමිත දිනයේ දී ඒ මණ්ඩලයේ ගිණුම් පොත්වල දක්වෙන වටිනාකම අනුව, මණ්ඩලයේ වත්කම් හා බැරකම් වන්නේ ය.

**තේ පර්යේෂණ ආඥාපනත ඉවත් කිරීම හා ආනුෂංගික විධිවිධාන.**

27. (1) තේ පර්යේෂණ ආඥාපනත මෙයින් ඉවත් කරනු ලැබේ.

(2) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයෙහි තේ පර්යේෂණ මණ්ඩලය සතුව තුබූ සියලු චංචල හෝ නිශ්චල දේපළ සහ දේපළ පිළිබඳ සියලු අයිතිවාසිකම් එදින සිට මණ්ඩලය සතු වන අතර ඒවා මණ්ඩලයේ දේපළ හා අයිතිවාසිකම් වන්නේ ය.

(3) තේ පර්යේෂණ මණ්ඩලය නීත්‍යානුකූලව ඇතුළත්ව තිබී නියමිත දිනට පෙරාතුව ම වූ දිනයෙහි වලංගුව පවතින ගිවිසුම් යටතේ ඒ මණ්ඩලය සතු සියලු අයිතිවාසිකම් හා බැඳීම් එදින සිට මණ්ඩලය සතු අයිතිවාසිකම් හා බැඳීම් ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) නියමිත දිනට පෙරාතුව ම වූ දිනයෙහි තේ පර්යේෂණ මණ්ඩලය යටතේ පත්වීමක් දරන සෑම නිලධරයකු, සේවකයකු හෝ වෙනත් තැනැත්තකුම එදින සිට මණ්ඩලයේ සේවයට මාරු කරනු ලැබිය යුතු ය.

(5) (4) වන උපවගන්තියේ විධිවිධාන යටතේ මාරු කරනු ලැබූ නිලධරයකු හෝ සේවකයකු හෝ වෙනත් තැනැත්තකු, සමස්ත වශයෙන් ගත් කළ නියමිත දිනට පෙරාතුව ම වූ දිනයෙහි ලංකා තේ පර්යේෂණ මණ්ඩලයේ වූ තම සේවයෙහි ලා ඔහු විසින් භුක්ති වින්දා වූ නියමයන්ට හා කොන්දේසිවලට අඩු වාසි සහගත තත්ත්වයක් නොදරන නියමයන් හා කොන්දේසි පිට, මණ්ඩලය විසින් සේවයෙහි යොදවා ගත යුතු ය.

(6) තේ පර්යේෂණ මණ්ඩලයේ සියලු වත්කම් හා බැරකම්, නියමිත දිනයේ දී ඒ මණ්ඩලයේ ගිණුම් පොත්වල දැක්වෙන වටිනාකම අනුව, මණ්ඩලයේ වත්කම් හා බැරකම් වන්නේ ය.

1958 අංක 12 දරන පනත ඉවත් කිරීම.

**28.** (1) 1958 අංක 12 දරන තේ සහනාධාර පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

(2) 1958 අංක 12 දරන තේ සහනාධාර පනත ඉවත් කරනු ලැබුව ද ඒ පනත යටතේ සාදනු ලැබ ඒ ඉවත් කිරීමට පෙරාතුව ම වූ දිනයෙහි බලපවත්නා සෑම නියෝගයක්ම, මේ පනතේ විධිවිධාන සමග එය අනුකූල වනතාක් දුරට, එබඳු යම් නියෝගයක "තේ පාලක" හෝ "පාලක" සම්බන්ධයෙන් ඇති යම් සඳහනක් "තේ කොමසාරිස්" සම්බන්ධයෙන් කෙරෙන සඳහනක් ලෙස කියවා තේරුම් ගත යුතු බවට වූ වෙනස් කිරීමට යටත්ව, මේ පනත යටතේ මණ්ඩලය විසින් සාදනු ලැබූ නියෝගයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

1970 අංක 15 දරන පනත ඉවත් කිරීම.

**29.** 1970 අංක 15 දරන ලංකා තේ මණ්ඩල පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

1957 අංක 51 දරන පනතේ VI වන කොටස ඉවත් කිරීම.

**30.** 1957 අංක 51 දරන තේ පාලන පනතේ VI වන කොටස මෙයින් ඉවත් කරනු ලැබේ.

අර්ථ නිරූපණය.

**31.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම පනතෙහි—

"කළමනාකරණය" යන්න එහි ව්‍යාකරණානුකූල වෙනස්වීම් සහ සජාතීය යෙදුම් සහිතව ගත් කල වගා කිරීම, නැවත වගා කිරීම්, පොහොර යෙදීම, පස් සංරක්ෂණය, නිෂ්පාදනය, සකස් කිරීම, පලදාව විකිණීම හා බැහැර කිරීම එයට ඇතුළත් වේ;

"කුඩා ඉඩම" යන්නෙන් සෑදූ තේ බවට පරිවර්තනය කිරීම පිණිස දළු නෙලා ගැනීමේ කාර්යය සඳහා තේ පැල වගා කරනු ලැබූත් ප්‍රමාණයෙන් අක්කර දහයකට අඩුවූත් බිම් කොටසක් අදහස් වේ:

"තේ" යන්න වගාවක් සම්බන්ධයෙන් යොදනු ලැබූ විට තේ පැල එයින් අදහස් වන අතර වෙන යම් පද සම්බන්ධයක දී සෑදූ තේ එයින් අදහස් වේ;

"තේ අපනයන කොමසාරිස්" යන්නෙන් තේ අපනයන කොමසාරිස්ගේ ධුරය දරන තැනැත්තා අදහස් වේ;

"තේ කර්මාන්ත ශාලාව" යන්නෙන් තේ දළු සෑදූ තේ බවට පරිවර්තනය කිරීම සඳහා යන්ත්‍ර සූත්‍රවලින් සජ්ජිත වූ යම් ස්ථානයක් අදහස් වේ;

"තේ කොමසාරිස්" යන්නෙන් මේ පනතේ කාර්යයන් සඳහා තේ කොමසාරිස් වශයෙන් හෝ එසේ ක්‍රියා කිරීමට හෝ පත් කරනු ලබන තැනැත්තා අදහස් වේ;

"තේ දළු" යන්නට සෑදූ තේ බවට පරිවර්තනය කිරීම පිණිස (පමනේ වේලීම යනුවෙන් හැඳින්වෙන කාර්යය හැර) සැකසුම් කිරීම් කිසිවකට භාජන කිරීමට පෙර තේ ගසින් ලබා ගන්නා දළු, පත්‍රාංකුර හා නොමේරූ නාටු ඇතුළත් වේ;

"තේ පර්යේෂණ මණ්ඩලය" යන්නෙන් තේ පර්යේෂණ ආඥා පනත යටතේ පිහිටුවන ලද ලංකා තේ පර්යේෂණ ආයතනයෙහි මණ්ඩලය අදහස් වේ;

"තේ පාලන අරමුදල" යන්නෙන් මේ පනතින් සංශෝධිත 1957 අංක 51 දරන තේ පාලන පනත යටතේ පිහිටුවන ලද තේ පාලන අරමුදල අදහස් වේ;

"තේ සහනාධාර මුදල" යන්නෙන් 1958 අංක 12 දරන තේ සහනාධාර පනත යටතේ පිහිටුවන ලද තේ සහනාධාර අරමුදල අදහස් වේ;

"නැවත වගා කිරීම" යන්න යම් තේ වත්තක් හෝ කුඩා ඉඩමක් සම්බන්ධයෙන් යොදනු ලැබූ විට, ඒ මුළු වත්තෙහි හෝ මුළු කුඩා ඉඩමෙහි හෝ එහි යම් කොටසක හෝ දැනට ඇති තේ පඳුරු සහ වෙනත් වෘක්ෂලතාදිය උදුරා දැමීම සහ ඒ වෙනුවට අලුත් තේ පැල යෙදීම අදහස් වන අතර, ඒ වත්තෙහි හෝ කුඩා ඉඩමෙහි හෝ කොටසක් නොවන යම් ප්‍රදේශයක තේ පැල වගා කිරීමක් සිදු වූ විට, මණ්ඩලය විසින් නියම කරනු ලැබිය හැකි කාලයක් ඇතුළත ඒ වත්තෙහි හෝ කුඩා ඉඩමෙහි එම වගාවට සමාන ප්‍රදේශයක තේ පඳුරු මුලිනුපුටා දමනු ලැබුවහොත් ඒ වගා කිරීම ද එම පාඨයට ඇතුළත් වේ;

"නිෂ්පාදකයා" යන්නෙන් තේ කර්මාන්ත ශාලාවක් නීත්‍යනුකූලව සන්තකයෙහි තබාගෙන සිටිමින් ඒ තේ කර්මාන්ත ශාලාවෙහි සෑදූ තේ නිෂ්පාදනය කරන යම් තැනැත්තෙක් අදහස් වේ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන් යම් මහා නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් වේ;

"පුනරුත්ථාපනය" යන්න යම් තේ වත්තක් හෝ කුඩා තේ ඉඩමක් සම්බන්ධයෙන් යොදනු ලැබූ විට, ඒ වත්තේ හෝ කුඩා ඉඩමේ කෘෂිකාර්මික තත්ත්වයන් වැඩිදියුණු කිරීම සඳහා සැලසුම් කරන ලද යම් ක්‍රියා මාර්ගයක් ඉන් අදහස් වන අතර, ඒ වත්තෙහි හෝ කුඩා ඉඩමේ පොහොර දැමීම, පස සංරක්ෂණය කිරීමේ කටයුතු යෙදීම සහ අතිරේක තේ පැළ හා වෙනයම් සුදුසු පැළෑටි සිටුවීම ඊට ඇතුළත් වේ;

"ප්‍රධාන අයකැමි" යන්නෙන් ප්‍රධාන රේගු අයකැමි වශයෙන් හෝ එසේ ක්‍රියා කිරීමට හෝ පත් කරනු ලැබූ තැනැත්තා අදහස් වේ;

"ප්‍රාග්ධන අරමුදල" යන්නෙන් මේ පනත යටතේ පිහිටුවනු ලැබූ ප්‍රාග්ධන අරමුදල අදහස් වේ;

"රාජ්‍ය සංස්ථාව" යන්නෙන් සම්පූර්ණයෙන් ම හෝ කොටසක් හෝ ආණ්ඩුව විසින් සපයන ලද අරමුදලින් පිහිටුවන ලද නැතහොත් පවත්වාගෙන යනු ලබන සංස්ථාවක් අදහස් වේ;

"ලංකා තේ ප්‍රචාරක මණ්ඩලය" යන්නෙන් තේ ප්‍රචාරක ආඥා පනත යටතේ පිහිටුවනු ලැබූ ලංකා තේ ප්‍රචාරක මණ්ඩලය අදහස් වන අතර, ඒ ආඥාපනත යටතේ ලංකාවේ තේ ප්‍රචාරක මණ්ඩලය යන නමින් සංස්ථාපිත මණ්ඩලය එයට ඇතුළත් වේ;

"වත්ත" යන්නෙන් සැදූ තේ බවට පරිවර්තනය කිරීම පිණිස දළු නෙලා ගැනීමේ කාර්යය සඳහා තේ පැළ වගා කරනු ලැබූත් ප්‍රමාණයෙන් අක්කර දහයක් හෝ ඊට වැඩි වූත් බිම් කොටසක් අදහස් වේ;

"සමාගම" යන්නෙන් යම් රටක තත්කාලයෙහි බල පවත්නා යම් නීතියක විධිවිධාන යටතේ පිහිටුවා සංස්ථාපිත යම් සමාගමක් අදහස් වේ; තවද

"සැදූ තේ" යන්නෙන් තේ ගසේ දළු, පත්‍රාංකුර සහ නොමේරූ නටුවලින් සැදා ගත් තේ අදහස් වන අතර, "කළු තේ", "හරිත තේ", "ක්‍ෂණික තේ", "කාබනේට් කළ තේ" හෝ වෙනත් සාරයන් එකතු කරන ලද තේ ද ඊට ඇතුළත් වේ.

ජාතික රාජ්‍ය සභාවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් 15 වැනි දිනට පෙර දායක මුදල් එවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය. මුදල් ලැබුණු දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත පමණද දායක මුදල් භාරගනු ලැබේ.